**ශීර්ෂය 150 - ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 150 - ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 21 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, අදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 4,843.98 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 4,743.80 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 100.17 ක් හෙවත් සියයට 2.07 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 4,653.98 | 4,652.78 | 1.20 | 0.03 |
| මූලධන | 190.00 | 91.03 | 98.97 | 52.09 |
| එකතුව | 4,843.98 | 4,743.81 | 100.17 | 2.07 |

**2.2** **ආදායම් ගිණුම**

**----------------**

**ඇස්තමේන්තගත හා තථ්‍ය ආදායම**

**------------------------------------**

අමාත්‍යාංශය විසින් 2015 වර්ෂය සඳහා අංක 20.03.02.21 දරන ආදායම් සංකේතය සඳහා ආදායම් ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණු අතර 2015 වර්ෂයේදී රු.මිලියන 21.15 ක ආදායමක් රැස්කර තිබුණි.

**2.3** **අත්තිකාරම් ගිණුම**

**-------------------**

**2.3.1** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**----------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**----------------------------------------------**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 15001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 3.50 | 2.60 | 0.02 | 5.23 | 20.00 | 7.85 |

**2.4** **අග්‍රිම ගිණුම**

**------------**

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/000/0437/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.මිලියන 1.09 ක් විය.

**2.5** **පොදු තැන්පත් ගිණුම**

**----------------------**

අමාත්‍යාංශය යටතේ වූ අංක 6000/0000/00/0018/0086/000 දරන තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 0.23 ක් විය.

**2.6** **විගණන නිරීක්ෂණය**

**----------------------**

ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

### 3.2 විසර්ජන ගිණුම

#### 3.2.1 අයවැය විචලනය

වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.4,070,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

### 3.3 අග්‍රිම ගිණුම්

2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් 4 දෙනෙකු වෙත අවස්ථා 09 කදී එකතුව රු.120,000 ක්වූ තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

### 3.4 ආදායම් ගිණුම

අමාත්‍යාංශ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් අංක 20.03.02.21 දරන ආදායම් සංකේතය සඳහා ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරය පැවැරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂය සඳහා වූ ආදායම් ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතය සඳහා ආදායම් ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. 2015 වර්ෂයේදී රු.මිලියන 21.15 ක ආදායමක් රැස්කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව හිඟහිටි ආදායම් පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත නියමිත දින හෝ ඊට පෙර ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ලිහිසි තෙල් ආනයනය සම්බන්ධයෙන් ලංකා ඛනිජතෙල් සංස්ථාව සමාගමක් සමඟ 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලය සඳහා නව ගිවිසුමකට එළඹ තිබුණද, එයට අදළව 2013, 2014 හා 2015 වර්ෂ සඳහා ලැබිය යුතු රු.මිලියන 5 ක ලිහිසිතෙල් බලපත්‍ර ගාස්තු 2015 දෙසැම්බර් 31 දින වන විටත් රැස්කර ගැනීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණු අතර ආදායම් ගිණුමේ හිඟ ආදායම් ලෙසද පෙන්වා නොතිබුණි.

(ඈ) ලිහිසි තෙල් ආනයනය සම්බන්ධයෙන් අමාත්‍යාංශය සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණු ආයතනවල විස්තර ඇතුළත් ලේඛනයක් අමාත්‍යාංශය විසින් පවත්වා නොතිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 15001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අමාත්‍යාංශයේ සේවයේ යෙදී සිට 2012 වර්ෂයේදී සේවය අතහැර ගිය රියදුරකුගෙන් අයවිය යුතුව තිබුණු එකතුව රු.74,634 ක් වූ ණය ශේෂය අයකර ගැනීමට අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වී තිබුණි.

**3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.6.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර භාණ්ඩ හා සේවා ලබා ගැනීමට වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රු.මිලියන 172 ක ප්‍රතිපාදනද, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් රු.මිලියන 18 ක ප්‍රතිපාදනද පාර්ලිමේන්තුව විසින් අනුමත කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**3.6.2 අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 වැනි මුදල් රෙගුලාසිය හා 1998 අගෝස්තු 03 දිනැති අංක IAI/98/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර සෑම ආයතනයකම විෂය පථයට අයත් අභ්‍යන්තර විගණන කාර්යයන් පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට වගකිව යුතු ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරීවරයකු විසින් නායකත්වය දරන අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවිය යුතු වුවත්, 2015 වර්ෂයේදී අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

**3.6.3 විගණන හා කළමනාකරණ කමිටුව**

2015 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 01 ක් පමණක් පවත්වා තිබුණි.

**3.6.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, එම වාර්තාව 2016 ජූලි 05 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ඌනතාවක් ලෙස හඳුනාගෙන තිබූ වර්ග 09 කට අයත් භාණ්ඩ අයිතමයන් 20 ක් අදාළ වගකිවයුතු පාර්ශවයන්ගෙන් ආපසු ලබාගෙන නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-------------------------------------------

හිටපු නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට ලබා දී තිබුණු රු.407,900 ක් වටිනා භාණ්ඩ වර්ග 04 ක් හා වටිනාකම ඉදිරිපත් නොකළ භාණ්ඩ වර්ග 22 කට අයත් භාණ්ඩ අයිතමයන් 102 ක් නැවත අමාත්‍යාංශය වෙත භාර දී නොතිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

-----------------------------------------------------------

2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ වූ ලිපියේ 3.3 ඡේදය ප්‍රකාරව අමාත්‍යවරයාගේ හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ පරිහරණය සඳහා රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ රාජ්‍ය සමාගමක වාහන යොදා ගන්නේ නම් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබාගතයුතු වුවද, අමාත්‍යාංශය විසින් අනුමැතියකින් තොරව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් වාහන 03 ක් 2015 වර්ෂයේදී ලබාගෙන තිබුණි.

**3.8 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

--------------------------------------------------------

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) සපුගස්කන්ද තෙල් පිරිපහදුව**

------------------------------

1969 වර්ෂයේදී ස්ථාපිත වර්ෂ 46 ක් පැරණි වූ සපුගස්කන්ද තෙල් පිරිපහදුවෙන් රටේ වැඩිවන ඛනිජතෙල් නිෂ්පාදන අවශ්‍යතාවය සැපයීමට නොහැකි වී තිබුණි. ඉතා අඩු පිරිවැයකට ඉන්ධන නිපදවීම සඳහා පහසුකම් ඇති සහ එමගින් පිරිපහදු මෙහෙයුම් කාර්යක්ෂමව උපරිමව කිරීමට හැකිවන නවීන ලෝකයේ උසස් තාක්ෂණයක් සහිත මෙහෙයුම් කෙරෙන වෙනත් පිරිපහදු සමඟ සැසඳීමේදී මෙම පිරිපහදුව ඉතා අඩු කාර්යක්ෂමතාවයකින් යුතුව මෙහෙයුම් සිදු කරනු ලබයි. කෙසේ වුවද, පිරිවැය ඵලදායී ආකාරයෙන් ඛනිජතෙල් නිෂ්පාදන වෙළඳපොළට සැපයීම තහවුරු කරගැනීම සඳහා යෝජිත සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීම හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (SOREM) 2016 ජූලි 15 දින දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණු අතර ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා 2016 මැයි 10 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති බව 2016 අගෝස්තු 11 දින අමාත්‍යාංශ ලේකම්වරිය විසින් මා වෙත දන්වා තිබුණි.

**(ආ) රට හරහා නල මාර්ග ව්‍යාපෘතිය**

---------------------------------

කොළඹ වරායේ සිට කොලොන්නාව ඛනිජතෙල් ගබඩා පර්යන්තය දක්වා ආනයනික පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සහ දැවිතෙල් වැනි ඛනිජතෙල් නිෂ්පාදන ප්‍රවාහනය කිරීම සඳහා දශක කිහිපයකට පෙර ස්ථාපනය කරන ලද නල මාර්ග අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි. ඉන් නල මාර්ග කිහිපයක් අළුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයේ පැවතීම හේතුවෙන් දැනටමත් අතහැර දමා තිබුණි. ආනයනය කරන ඛනිජතෙල් නිෂ්පාදනවලින් විශාල ප්‍රමාණයක් මෙම පරිහානියට පත් නලමාර්ග හරහා කොලොන්නාව ඉන්ධන ගබඩා පර්යන්තයට ගෙන යන බැවින් ඒවා අළුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම කඩිනමින් කළ යුතුව තිබුණි. “රට හරහා

නල මාර්ග ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීම සඳහා 2008 වර්ෂයේ සිටම වරින් වර අමාත්‍ය මණ්ඩල තීරණ ගෙන තිබුණු අතර මෙම සම්පූර්ණ ව්‍යාපෘතියම ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීමේ කටයුතු කොන්ත්‍රාත්කරු විසින්ම සිදුකිරීමේ පදනම (EPC Ternkey Contract) මත සියයට 100 ක් මූල්‍යනය වන රජයෙන් රජයට (G to G) ප්‍රසම්පාදන ක්‍රමවේදය මත ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණු බවත්, අදාළ විදේශ දූත මණ්ඩල මගින් නිර්දේශ කරන එක් පරිපූර්ණ යෝජනාවක් පමණක් අදාළ රටවල් 04 කින් කැඳවීමට අමාත්‍ය මණ්ඩල තීරණය කර තිබුණු බවත්, මේ සඳහා ව්‍යාපෘති යෝජනා කැඳවීමට (RFP – Request for Proposal) අවශ්‍ය යෝජනාව සකස් කර ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවට (TEC) යොමු කර ඇති බවත් එම කමිටුවෙන් අමාත්‍යාංශය වෙත ව්‍යාපෘති යෝජනා ලැබුණු පසු අදාළ රටවල් මඟින් යෝජනා කැඳවීමට කටයුතු කරන බවත් මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරිය විසින් 2016 අගෝස්තු 11 දින මා වෙත දන්වා තිබුණි.

**(ඇ) ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය**

-----------------------------------------

සන මීටර 12500 (මෙට්‍රික් ටොන් 10000) ක ධාරිතාවයෙන් යුත් තෙල් ටැංකි 100 කින් සහ වෙනත් පහසුකම්වලින් සමන්විතව 1930 වර්ෂයේදී ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකිර්ණය ඉදිකර තිබුණි. මෙම තෙල් ටැංකි සංකීර්ණය 1961 වර්ෂයේදී ශ්‍රී ලංකා රජයේ ඉල්ලීමක් මත එවකට මෙහි හිමිකාරීත්වය දැරූ බ්‍රිතාන්‍ය රජය විසින් ඉඩම, තෙල් ටැංකි සංකීර්ණය, ගොඩනැගිලි හා අනෙකුත් පහසුකම් පිළිබඳ හිමිකම 1964 වර්ෂයේදී ශ්‍රී ලංකා රජයට පවරා දී තිබුණි. දැනට පවතින 99 ක් වූ මුළු තෙල් ටැංකි ප්‍රමාණයෙන් 14 ක් ලංකා ඉන්දියන් තෙල් සමාගම විසින් භාවිතා කරමින් පවතී. අතහැර තිබුණු අනෙකුත් ටැංකි සංවර්ධනය කිරීම සඳහා 2015 අප්‍රේල් 29 දින සාමාජිකයින් 06 දෙනෙකුගෙන් සැදුම්ලත් ඒකාබද්ධ කාර්යසාධක බලකායක් ස්ථාපනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම්තුමිය විසින් අදහස් දක්වමින් 2016 ජූනි 06 දින ගරු අගමැතිතුමා විසින් ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ ඉහළ කොටසේ මෙහෙයුම් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම විසින් එළඹෙන ලද ඒකාබද්ධ ව්‍යාපාරය වෙත භාරදීම මැයෙන් අමාත්‍ය මණ්ඩල සටහනක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා විසින් 2016 අප්‍රේල් 28 දින ඉදිරිපත් කර තිබුණු "ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණයේ ඉහළ කොටස පුනරුත්ථාපනය සහ සංවර්ධනය කිරීම" මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාල අමාත්‍ය මණ්ඩල තීරණය අවලංගු කිරීමටත්, ටැංකි 84 කින් සමන්විත ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණයේ ඉහළ කොටසේ මෙහෙයුම් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම විසින් එළඹෙන ලද ඒකාබද්ධ ව්‍යාපාරය වෙත භාරදීම සහ කාලරාමුවක් මත පදනම් වූ ක්‍රියාකාරී සැලැස්මකට අනුව එක් වරකට ටැංකි 30 ක් බැගින් සංවර්ධනය කිරීමටත්, ඛනිජතෙල් සම්පත් සංවර්ධන ගරු අමාත්‍යතුමා සහ සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යාන්තර වෙළඳ ගරු ඇමතිතුමා සහ වෙනත් අදාළ බලධාරීන් හා එක්ව ඉහත කාරණය සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස සුදුසු ක්‍රමවේදයක් තීරණය කර ඒ පිළිබඳව ගරු අමාත්‍ය මණ්ඩලය වෙත දැනුම් දෙන ලෙසට ගරු අගමැතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලෙසට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇති බවත් 2016 අගෝස්තු 11 දින මා වෙත වාර්තාකර තිබුණි.

(ඈ) **බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ භූගත තෙල් නල පද්ධතිය**

---

ඉහත සඳහන් භූගත තෙල් නල පද්ධතිය රු.මිලියන 1,000 ක වියදමින් ඉදිකිරීම සඳහා 2010 වර්ෂයේදී රු.මිලියන 5 ක් වැය කර තාක්ෂණික අධ්‍යනයක්ද, 2012 වර්ෂයේදී රු.මිලියන 01 ක් වැයකර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ප්‍රසම්පාදනයේ සවිස්තරාත්මක සැලැසුම්ද, සකස්කර තිබුණි. කෙසේ වුවද ගුවන් තොටුපලේ මිලියන 06 ක වාර්ෂික මගී ධාරිතාවක් ඉහළ නැංවීම වෙනුවෙන් වූ ව්‍යාපෘති යෝජනාව අවලංගු කර එය මිලියන 09 ක වාර්ෂික මගී ධාරිතාවක් දක්වා වැඩි කිරීමට 2013 සැප්තැම්බර් 05 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. ඒ අනුව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් සිදුකිරීමට නියමිත එහි භූගත ඉන්ධන නල පද්ධතියෙහි විෂය පථයද වෙනස් කිරීමට සිදුවී තිබුණි. මෙම ව්‍යාපෘතිය ලංකා ඛනිජතෙල් සංස්ථාව සහ ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම යන ආයතන දෙකම සමගාමීව ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘතියක් වන බවත්, මේ සඳහා මූලධනය සපයා ගැනීමේ ගැටළු පවතින බැවින් මූල්‍ය පහසුකම් සහිතව ලංසු කැඳවීමට කටයුතු කරන බවත් එම ලංසු ඇගයීම අවසන් අදියරේ පවතින බවත් මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරිය විසින් 2016 අගෝස්තු 11 දින මා වෙත දන්වා තිබුණි.

## 3.10 කාර්යසාධනය

---

තෙල් ගවේෂණ කටයුතුවලින් පරිසරයට හා ජලයට වන හානිය පිළිබඳව සමීක්ෂණ කටයුතු වෙනුවෙන් ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය සඳහා 2015 වර්ෂයේදී රු.මිලියන 50 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2015 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මටද මෙම ව්‍යාපෘතිය ඇතුළත්ව තිබුණි. එසේ වුවද මේ සඳහා වූ ප්‍රසම්පාදනයේ මූල්‍ය යෝජනා විවෘත කිරීමේදී ගැටළු මතුවී තිබුණු බැවින් එම ප්‍රසම්පාදනය අවලංගු කර ව්‍යාපෘතියේ විෂය පථය පුළුල් කර නාරා ආයතනයෙන් නව මිල ගණන් ලබාගෙන ව්‍යාපෘතිය නාරා ආයතනයට පිරිනැමීමට අමාත්‍යාංශ ලේකම් උපදෙස් ලබාදී තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දින ගිවිසුම් අත්සන් කර රු.7,433,106 ක ප්‍රාරම්භක අත්තිකාරමක් වශයෙන් ගෙවා තිබුණු අතර ගිවිසුම අනුව මාස 08 ක් තුළ එනම් 2016 අගෝස්තු 31 දිනට පෙර ව්‍යාපෘතිය අවසන් කළ යුතු වුවත්, විගණන දිනය වූ 2016 අගෝස්තු 19 දින වන විටත් සැලකිය යුතු ප්‍රගතියක් පෙන්වා නොතිබුණි.

## 3.11 පාඩු හා හානි

---

2015 වර්ෂයේදී හදිසි අනතුරු හේතුවෙන් අමාත්‍යාංශය සතු වාහන 10 කට හානි සිදුවී තිබුණු අතර ඒවා අලුත්වැඩියා කිරීම සඳහා රු.530,498 ක් වැය කර තිබුණි. එහෙත් ඒ සඳහා රක්ෂණ වන්දි වශයෙන් රු.395,446 ක් පමණක් ලැබී තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයට සිදුවී තිබුණු රු.135,052 ක පාඩුව සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කර නොතිබුණි.

## 3.12 කළමනාකරණ දුර්වලතා

---

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) මොරටුව විශ්වවිද්‍යාලය මඟින් සිංගප්පූරුවේදී පවත්වනු ලැබූ පුහුණු වැඩසටහනට සහභාගී වී තිබුණු නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් රු.1,231,864 ක් වැයකර තිබුණි. එම වියදම 2015 වර්ෂයේ අමාත්‍ය කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ වැය විෂය යටතේ වූ මුළු ප්‍රතිපාදනවලින් සියයට 61 ක් වී තිබුණි.

(ආ) "සංවර්ධනය වෙමින් පවතින රටවල සූර්යබලය භාවිතය" මැයෙන් වූ විකල්ප බලශක්ති ප්‍රභවයන් පිළිබඳව 2015 ජුනි 18 දින සිට අගෝස්තු 12 දින දක්වා දින 55 ක කාලයක් චීනයේ පැවති පුහුණු පාඨමාලාවක් වෙනුවෙන් එම විෂය ක්ෂේත්‍රයට සම්බන්ධයක් නොමැති අමාත්‍යාංශයේ නීති නිලධාරිනිය සහභාගී කරවීමට කටයුතු කර තිබුණු අතර ඇය වෙනුවෙන් රු.187,070 ක් අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි. මෙම තනතුර දෙපාර්තමේන්තුගත තනතුරක් වන බවත්, නිලධාරිනිය මෙම ක්ෂේත්‍රයේ ගිවිසුම් සහ සියළුම නීතිමය කාර්යයන් සම්බන්ධයෙන් කටයුතු කරන අතර විවිධ කමිටු හා විමර්ශණ කමිටුවලද කටයුතු කරන බවත්, එබැවින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ලබා ගැනීම රාජකාරිවලට මනා පිටුවහලක් වන නිසා එම විදෙස් පුහුණුවට නිලධාරිනිය සහභාගී කරවන ලද බවත්, ඇය වෙනුවෙන් ගෙවිය යුතු දීමනා සහ වීසා ගාස්තු ගෙවීමට පියවර ගෙන ඇති බවත් මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරිය විසින් 2016 අගෝස්තු 11 දින මා වෙත දන්වා තිබුණි.

(ඇ) 2015 අගෝස්තු 01 දින පවත්වා තිබුණු රියදුරන්ගේ පුහුණු වැඩමුළුවක් වෙනුවෙන් එක් අයෙකුට රු.3,500 බැගින් රියදුරන් 30 දෙනෙකු සඳහා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය වෙත රු.105,000 ක් ගෙවා තිබුණු අතර අමාත්‍යාංශයේ කිසිදු රියදුරකු මේ සඳහා සහභාගී වී නොතිබුණි. සහභාගී නොවූ රියදුරන්ගේ වැටුපෙන් එම පුහුණු පාඨමාලා ගාස්තු අයකර ගෙන නොතිබුණු අතර බාහිර ආයතනවලින් සහභාගී වූ රියදුරන් වෙනුවෙන් වැය කළ මුදල්, එම ආයතනවලින් ආපසු අය කර ගැනීමටද කටයුතු කර නොතිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ පුහුණු කටයුතු සඳහා ප්‍රතිපාදිත මුදල් බාහිර ආයතනවල නිලධාරීන් වෙනුවෙන් යොදවා තිබීමෙන් අමාත්‍යාංශ නිලධාරීන්ගේ පුහුණුවීම් අවස්ථා මගහැරී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා පදනම් ආයතනය සමඟ සම්බන්ධව 2015 වර්ෂයේදී මැලේසියාවේදී පවත්වන ලද පුහුණු වැඩසටහනට සහභාගී වී තිබුණු අතිරේක ලේකම් (පාලන) වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු.516,181 ක් වැයකර තිබුණි. දිවයිනෙන් පිටවූ සහ ආපසු පැමිණි දිනයන් සම්බන්ධ ගුවන් ටිකට් පත්වල පිටපත්, 2013 අප්‍රේල් 16 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අංක එච්ආර්ඩී/සීඑච්අයි/එස්/194 දරන ලිපිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු වූ වාර්තාවේ පිටපතක්, ලබාගත් පුහුණුව පිළිබඳ විස්තර සහිත වාර්තා, පුහුණු සහතිකය ආදී පාඨමාලාවට සහභාගී වූ බව සනාථ කෙරෙන සාක්ෂි අමාත්‍යාංශයෙහි නොතිබුණි. තවද ඉකුත් වර්ෂ කීපයකදීම මෙම නිලධාරිනිය, අමාත්‍යාංශ කාර්ය මණ්ඩල පුහුණු කිරීම් වැය විෂයය යටතේ ප්‍රතිපාදිත මුදලින් සියයට 25 කට වැඩි ප්‍රතිශතයක් යොදා ගනිමින් මෙවැනි සම්මන්ත්‍රණවලට අඛන්ඩව සහභාගී වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් වරින් වර විගණන විමසුම්ද නිකුත් කර තිබුණි.

## 3.13 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 08 | 08 | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 52 | 35 | 17 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 27 | 21 | 06 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 05 | - | 05 |
| | **එකතුව** | **97** | **70** | **32** | **05** |